සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

09 ශ්‍රේණිය

# ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ගෝලයන්ට ශුද්ධාත්ම බලය ලැබුණු දිනය හඳුන්වන්නේ,

(1) පාස්කුව නමිනි. (2) පෙන්තකොස්ත නමිනි.
(3) මහ සිකුරාදා නමිනි. (4) මහ බ්‍රහස්පතින්දා නමිනි.

02. ශුද්ධාත්ම දානය ලැබූ පසු ප්‍රේරිතයන් බලවත්ම ක්‍රියාව කළ ස්ථානය වන්නේ,

(1) සුදර්ශන දොරටුවයි. (2) බෙතෙස්දා පොකුණයි.
(3) ජෙරුසලම් දේව මාළිගාවයි. (4) ගෙත්සෙමන උයනයි.

03. තබීතා ජීවත් වූ ගමෙහි නම වන්නේ,

(1) බෙතානිය යි. (2) ගලීලයයි. (3) ජොප්පාවයි. (4) ජෙරිකොවයි.

04. කිතුණු සභාව වෙනුවෙන් තම ජීවිතය පුද කළ ප්‍රථම වේදසාක්ෂිකයා වන්නේ,

(1) පාවුල් තුමා ය. (2) ස්තේපන් තුමා ය.
(3) පිලිප් තුමා ය. (4) බාර්තාබස් තුමා ය.

05. මුල් කිතුණු සභාවේ සිටි උපස්ථායකයින් ගණන වන්නේ,

(1) 2 කි. (2) 4 කි. (3) 7 කි. (4) 10 කි.

06. ජේසුස් වහන්සේ සිය ප්‍රථම දේව බල ප්‍රකාශනය සිදු කළේ,

(1) බෙත්ලෙහෙම් නුවරදී ය. (2) නාසරෙත් නුවරදී ය.
(3) බෙත්සයිද්‍රා නුවරදී ය. (4) කානා නුවරදී ය.

07. ජේසුතුමා සබත් දිනයේ ධර්මශාලාවේ දී සුව කළ රෝගියා වූයේ,

(1) අංශභාග රෝගියා ය. (2) අන්ධ මිනිසෙකු ය.
(3) අතක් පණ නැති මිනිසෙකු ය. (4) කොර වූ මිනිසා ය.

08. "ස්වාමීන් වහන්සේ මාගේ එඬේරාණෝ ය. අග හිඟ එම නොවන්නේ ය." මෙම පාඨය අයත් බයිබල් ග්‍රන්ථය වන්නේ,

(1) ගීතාවලිය ය. (2) හිතෝපදේශය ය.
(3) 1 කොරෙන්ති ය. (4) ධර්ම දේශකයා ය.

09. මුල් කිතුණු සභාවේ ප්‍රේරිතයන්ට නිර්භයව කටයුතු කිරීමට සහය වූයේ,

(1) දෙවියන් වහන්සේ ය. (2) ජේසුස් වහන්සේ ය.

(3) ශුද්ධාත්මයාණන් වහනසේ ය. (4) මුල් කිතුණු සභාවය.

10. "ඔබ මට වඩා දැහැමි ය." මෙලෙස පැවසුවේ,

(1) දාවිත් ය. (2) සාවුල් ය. (3) ස්තේපන් ය. (4) ආබ්‍රහම් ය.

11. ජේසුස් වහන්සේ අපහට ඉගැන් වූ පරාර්ථකාමී යාච්ඤාව වන්නේ,

(1) උත්තම පූජක යාච්ඤාවයි. (2) මල් උයනේ යාච්ඤාවයි.

(3) ස්වාමින්ගේ යාච්ඤාවයි. (4) කුරුස ගසේ යාච්ඤාවයි.

12. ශාරපෙත් හි වැන්දඹුව මගින් පෝෂණය ලැබූ දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා ය. (2) ජෙරමියා ය. (3) මීකා ය. (4) එළියා ය.

13. ප්‍රඥාව සමිඳුන්ගේ දීමනාවක් බව සඳහන් වන්නේ,

(1) ගීතාවලිය පොතේ ය. (2) රාජාවලිය පොතේ ය.

(3) හිතෝපදේශ පොතේ ය. (4) උත්පත්ති පොතේ ය.

14. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව සනාථ කරමින් දේශනා කළේ,

(1) සාවුල් ය. (2) පේදුරු ය. (3) ස්තේපන් ය. (4) ජොහාන් ය.

15. නව යොවුන් වියට පා තැබූ ඔබ වඩා සැලකිල්මත් විය යුත්තේ,

(1) දෙමාපියන් කැමති දේ ඉටු කිරීමට ය. (2) සමාජය කැමති දේ ඉටු කිරීමට ය.

(3) ඔබේ සිතට එකඟ දේ කිරීමට ය. (4) දෙවිඳුන්ට කැමති දේ කිරීමට ය.

16. ශු. බයිබලයේ සඳහන් සත් ගුණවත් මිනිසා වන්නේ,

(1) ලොත් ය. (2) නෝවා ය. (3) ආබ්‍රහම් ය. (4) මෝසෙස් ය.

17. දාවිත්ට සාවුල්ව මුණ ගැසුනේ,

(1) පාළුකරයේ දී ය. (2) වනාන්තරයේ දී ය.

(3) ගල් ගුහාවක දී ය. (4) කඳු මුදුනක දී ය.

18. ස්තේපන් තුමාව මරණයට පත් කරනු ලැබුවේ,

(1) ගෙල සිඳ දැමීමෙනි. (2) ගල් ගැසීමෙනි.

(3) කඩු පහර දීමෙනි. (4) කුරුසියක් මත ඇණ ගැසීමෙනි.

19. දෙවිඳුන් අපේක්ෂා කරන ලෙසට සතුරාට ප්‍රේම කරමින් ආදර්ශයක් ලබා දුන්නේ,

(1) සාවුල් ය. (2) දාවිත් ය. (3) සලමොන් ය. (4) ලොත් ය.

20. කිතුණු සභාව බල ගැන්වී වර්ධනය වූයේ,

(1) යාච්ඤාව හා ශුද්ධාත්ම බලය මගිනි.

(2) යාච්ඤාව හා මුල් සභාවේ කැපවීම තුළිනි.

(3) ශුද්ධාත්ම බලය හා මුල් සභාවේ කැපවීම මගිනි.

(4) යාච්ඤාව හා වේදසාක්ෂිකයන්ගේ දිවිපිදීම තුළිනි.

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) යාච්ඤාව මඟින් සන්නිවේදනය සිදුවන්නේ කවුරුන් අතරද?

(ii) ජේසුස් වහන්සේ ස්වර්ගාරෝපණය වන අවස්ථාවේ ප්‍රේරිතයන් වෙත පවරන ලද මෙහෙවර කුමක්ද?

(iii) උපස්ථායකයෙකු සතු විය යුතු සුවිශේෂ ගුණාංග 02 ක් ලියන්න.

(iv) බීමත්කම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 02 ක් ලියන්න.

(v) මුල් කිතුණු සභාවෙන් ලබා ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.

(vi) ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රථම ප්‍රාතිහාර්ය සඳහන්ව ඇති ශුභාරංචි ග්‍රන්ථය කුමක්ද?

(vii) දාවිත් රජුගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 02 ක් ලියන්න.

(viii) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02 නම් කරන්න. (ල. 2 x 8 = 16)

02. (i) දොර්කස්ව හඳුන්වනු ලැබූ අනෙක් නම හා එහි අර්ථය ලියා දක්වන්න. (ල. 02)

(ii) දොර්කස්ව මරණින් උත්ථාන කළේ කවුරුන්ද? ඊට පෙර කළේ කුමක්ද? (ල. 03)

(iii) දොර්කස්ගේ ජීවිතයෙන් ලබාගත හැකි ආදර්ශ 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

03. (i) ප්‍රේරිතයන් විසින් කරන ලද ප්‍රථම හාස්කම කුමක්ද? (ල. 02)

(ii) ඊට සම්බන්ධ ශ්‍රාවකයින් දෙදෙනා කවුරුන්ද? (ල. 03)

(iii) එහිදී සිදු වූ හාස්කම කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

04. (i) ජාති, ආගම් භේදයකින් තොරව යහපත් දිවියක් ගත කිරීමට උපදෙස් ලබාදෙන බයිබල් ග්‍රන්ථ 02 නම් කරන්න. (ල. 02)

(ii) ගලාති පොතේ සඳහන් මාංශික තෘෂ්ණා වලින් 06 ක් ලියන්න. (ල. 03)

(iii) තරුණ වියේ සිටින දරුවකු ලෙස දේව ගෞරවය උදෙසා ඔබට කළ හැකි දේවල් 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

05. (i) ජේසුස් වහන්සේ උදෙසා ජීවිත කැපකරමින් සභාවේ දියුණුව උදෙසා ක්‍රියා කළ පිරිස හඳුන්වනු ලැබූ නම කුමක්ද? (ල. 02)

(ii) රෝම අධිරාජ්‍යාගෙන් මුල් කිතුණු සභාව විඳි පීඩාවන් 03 ක් ලියන්න. (ල. 03)

(iii) ස්තේපන් තුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

06. (i) සාවුල් හැරීම ලැබුවේ කුමන නගරයට යමින් සිටිය දී ද? (ල. 02)

(ii) ඔහු හැරීම ලැබීමට පෙර කිතුණු ජනතාවට කළ පීඩා 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) ජීවිත පරිවර්තනයක් ඇති කරගත් කිතුණු දරුවෙකු ලෙස ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියා දක්වන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 1 ) | 03. ( 3 ) | 04. ( 2 ) | 05. ( 3 ) | 06. ( 4 ) | 07. ( 3 ) | 08. ( 1 ) | 09. ( 3 ) | 10. ( 2 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 1 ) | 15. ( 4 ) | 16. ( 2 ) | 17. ( 3 ) | 18. ( 2 ) | 19. ( 2 ) | 20. ( 1 ) |

(ල. 2 x 20 = 40)

## II කොටස

01. (i) කිතුනුවා හා දෙවියන් වහන්සේ අතර
(ii) පොළවේ සීමාන්තරය දක්වා මාගේ සාක්ෂිකාරයෝ වන්න.
(iii) පෙළ පොතෙහි 40 පිටුවේ ඇති ගුණාංග වලින් 02 ක් තිබීම.
(iv) රෝගී වීම, මුදල් අපතේ යාම, පවුලේ අසමගිය වැනි කරුණු 02 ක් තිබීම.
(v) එකමුතුකම, ඉගැන්වීම, රොටි කැඩීම, සියල්ල පොදුවේ තබා ගැනීම ආදී දේවලින් 02 ක් තිබීම.
(vi) ජොහන් ශුභාරංචිය.
(vii) ගුභාවේදී සාවුල්ගේ ජීවිතය මිදීම, මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.
(viii) ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර / මෙහෙය ඇරඹීමට පෙර / ප්‍රාතිහාර්ය කිරීමට පෙර / දුක් ප්‍රාප්තියට මුහුණ දීමට පෙර (ල. 2 x 8 = 16)

02. (i) තබීතා, අර්ථය - මුවදෙන (ල. 02)
(ii) පේදුරුතුමා, තබීතාගේ දේහය ළඟ දණින් වැටී යාච්ඤා කිරීම. (ල. 03)
(iii) සිසුන් ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න. (පෙළ පොතෙහි 37, 38 පිටු වලට අදාළව) (ල. 06)

03. (i) සුදර්ශන දොරටුව අසල සිටි කොරා සුව කිරීම (ල. 02)
(ii) පේදුරු හා ජොහාන් (ල. 03)
(iii) ක්‍රියා 3:1-10 දක්වා කොටසේ සඳහන් සිදුවීම කෙටියෙන් ලියා තිබීම ප්‍රමාණවත් වේ. (ල. 06)

04. (i) හිතෝපදේශ, ධර්ම දේශකයා (ල. 02)
(ii) ගලාති 5:19-21 දක්වා ඇති මානසික තෘෂ්ණා වලින් 6 ක් ලියා තිබීම. (ල. 03)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) වේදසාත්ෂිකයන් (ල. 02)
(ii) අසාධාරණ නඩු තීන්දු ලබාදීම. / කිතුණුවන් ජුදා ව්‍යවස්ථාවට අපහාස කරන්නන් ලෙස සැලකීම ආදී පෙළපොතෙහි 39 පිටුවේ සඳහන් කරුණු වලින් 2 ක් තිබීම. (ල. 03)
(iii) පෙළපොතෙහි 40, 41 පිටු වලට සඳහන් කරුණු 03 ක් කෙටියෙන් විස්තර කර තිබීම. (ල. 06)

06. (i) දමස්කයට (ල. 02)
(ii) ප්‍රේරිතයන් මන්ත්‍රණ සභාව වෙත ගෙන යාම. / ඔවුන් අල්ලා නිරයෙහි දැමීම. වැනි පිළිතුරු 2 ක්. (ල. 03)
(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)